බාහිර උපාධි හා විස්තාරිත පාඨමාලා ඒකකය
External Degrees and Extension Courses Unit
ශ්‍රී ජයවර්ධනපුර විශ්වවිද්‍යාලය
University of Sri Jayewardenepura

| | | | |
|---|---|---|---|
| මගේඅංකය My Number | USJP/EEX/13/2025 | ලිපිනය Address | තැපැල් පෙට්ටිය 10, ගංගොඩවිල Post Box 10,Gangodawila නුගේගොඩ, ශ්‍රී ලංකා Nugegoda, Sri Lanka, |
| ඔබේඅංකය Your Number | | | |
| දුරකථනය Telephone | 011-2801481,011-3132496 | වෙබ්අඩවිය Website | www.external.sjp.ac.lk |
| ෆැක්ස් Fax | | විද්‍යුත් තැපැල E-mail | info.ext@sjp.ac.lk |


2025-01-16

ප්‍රිය ශිෂ්‍ය/ ශිෂ්‍යාවනි

## පුනර් අපේක්ෂකයන් සඳහා විභාග අයදුම්පත් කැඳවීම - 2025

## විද්‍යාවේදී ව්‍යාපාර අධ්‍යයන (සාමාන්‍ය) බාහිර උපාධි තෙවන වසර පළමු අර්ධ වාර්ෂිකය 2020/2021 අධ්‍යයන වර්ෂ සඳහා පුනර් පරීක්ෂණය

01. පුනර් පරීක්ෂණය සඳහා අයදුම් කිරීමට සහ පරීක්ෂණ ගාස්තු ගෙවීම සඳහා පහත උපදෙස් අනුගමනය කරන ලෙස කරුණාවෙන් දන්වමි.

| | |
|---|---|
| **පුනර් පරීක්ෂණ අයදුම්පත සහ පරීක්ෂණ ගාස්තු ගෙවිය යුතු ගිණුම් අංකය** | www.external.sjp.ac.lk යන වෙබ් අඩවියේ B.Sc. Business Studies (General) External Degree/ Exam Applications වෙත පිවිස ඉහත පරීක්ෂණය යටතේ ඇති වෙබ් පිටුවේ ඔබගේ ජාතික හැඳුනුම්පත් අංකය "v" අකුර රහිතව යෙදීමෙන් බාගත (Download) කර ගත හැක. |
| **පුනර් පරීක්ෂණ ගාස්තු**<br>එක් විෂයයක් සඳහා<br>විෂයයන් 2 ක් සඳහා<br>විෂයයන් 3 ක් හෝ වැඩි ගණනක් සඳහා | <br>රු. 1500.00<br>රු. 3000.00<br>රු. 4000.00 |
| **අයදුම්පත් යොමු කළ යුතු ලිපිනය** | **ජ්‍යෙෂ්ඨ සහකාර ලේඛකාධිකාරී, බාහිර උපාධි හා විස්තාරිත පාඨමාලා ඒකකය, තැපැල් පෙට්ටිය අංක 10, ශ්‍රී ජයවර්ධනපුර විශ්වවිද්‍යාලය, ගංගොඩවිල, නුගේගොඩ යන ලිපිනයට ලියාපදිංචි තැපෑලෙන් එවිය යුතුය.** |
| **අයදුම්පත් භාරගන්නා අවසාන දිනය** | **2025 පෙබරවාරි 21** |
| **ලියාපදිංචිය දීර්ඝ කිරීම**<br>**2020 සහ 2021 අධ්‍යයන වර්ෂයේ සිසුන්** පහත පරිදි ලියාපදිංචිය දීර්ඝ කර ගැනීම අනිවාර්ය වේ.<br>**2020 අධ්‍යයන වර්ෂය - 2025-12-31 දින දක්වා**<br>**2021 අධ්‍යයන වර්ෂය - 2026-01-16 දින දක්වා** | **ලියාපදිංචිය දීර්ඝ කිරීම පිළිබඳ විස්තර www.external.sjp.ac.lk වෙබ් අඩවියේ B.Sc. Business Studies (General) External Degree/ Registration Renewals වෙබ් පිටුවට පිවිස ලබා ගත හැක.** |

02 . <u>සැලකිය යුතුයි</u>

I. විද්‍යාවේදී ව්‍යාපාර අධ්‍යයන (සාමාන්‍ය) බාහිර උපාධි තෙවන වසර පළමු අර්ධ වාර්ෂික පරීක්ෂණය සඳහා ;

a) වෛද්‍ය සහතික ඉදිරිපත් කර අනුමත වී ඇති විෂයන් (ප්‍රතිඵල ලේඛනයේ **MC** සංකේතයෙන් දැක්වේ.)

b) පෙනී සිට **D,E** සාමාර්ථ ලැබූ සියලුම විෂයන්

c) අයදුම් කර පෙනී නොසිටි **(AB)** විෂයන්

d) අයදුම් නොකලද මෙම පරීක්ෂණයට පෙනී සිටීමට බලාපොරොත්තු වන විෂයයන්

ඉහත a,b,c,d යන කරුණු වෙනුවෙන් පුනර් පරීක්ෂණය සඳහා ගාස්තු ගෙවා අයදුම්පත් යොමු කළ යුතු වේ.

II. **ඉහත පරීක්ෂණයට පෙනී සිටීම සඳහා <u>ඔබ විසින් පාඨමාලා ගාස්තු වාරික 3 ම සම්පූර්ණ කර තිබීම අනිවාර්ය වේ.</u> එසේ ගෙවා නොමැති අයදුම්පත් සහ නියමිත පරිදි පරීක්ෂණ ගාස්තු නොගෙවන ලද අසම්පූර්ණ අයදුම්පත් දැනුම් දීමකින් තොරව ප්‍රතික්ෂේප කරනු ලැබේ.**

III. නියමිත පරිදි සම්පූර්ණ කරන ලද අයදුම්පත් පරීක්ෂණ ගාස්තු ගෙවීමෙන් අනතුරුව අයදුම්පත් භාර ගන්නා අවසන් දිනට ප්‍රථම, **ඉහත සඳහන් ලිපිනයට ලියාපදිංචි තැපෑලෙන් එවිය යුතුයි.** අයදුම්පත් බහා එවනු ලබන කවරයේ ඉහළ වම් කෙළවරේ පරීක්ෂණයේ නම සඳහන් කළ යුතු වේ.

IV. අයදුම්පත් භාර ගැනීමේ අවසන් දිනය **2025 පෙබරවාරි 21** වන අතර එම දිනයෙන් පසුව කිසිදු හේතුවක් මත අයදුම්පත් භාර ගනු නොලැබේ.

V. පරීක්ෂණ ගාස්තු ගෙවීම සඳහා එක් අයදුම්කරුවකු වෙනුවෙන් **සුවිශේෂී ගිණුම් අංකයක්** බැගින් ඇති අතර අදාළ ගිණුම් අංකයට පමණක් ගෙවීම් කළ යුතුය. (එහි ජායා පිටපතක් ළඟ තබා ගත යුතු අතර වෙනත් ගිණුම් අංකවලට ගෙවන ලද මුදල් පිළිබඳ විශ්වවිද්‍යාලය වග කියනු නොලැබේ)

VI. විදෙස්ගත සිසුන් සඳහා විභාග අයදුම්පත් ඉදිරිපත් කර මාර්ගගත ක්‍රමය ඔස්සේ පරීක්ෂණ (EDECU Online Distance Supervision Examinations) සඳහා පෙනී සිටිය හැකි වේ. ඒ සම්බන්ධයෙන් විස්තර http://external.sjp.ac.lk/online-exminations-for-migrated-students/ වෙත පිවිසීමෙන් ලබාගත හැකි වේ.

VII. පරීක්ෂණයට අදාළ කාල සටහන **external.sjp.ac.lk** යන බාහිර උපාධි හා විස්තාරිත පාඨමාලා ඒකකයේ වෙබ් අඩවියෙහි පල කරන අතර සියලු දැනුවත් කිරීම් වෙබ් අඩවිය හරහා පමණක් සිදු කරන බැවින් නිරතුරුවම වෙබ් අඩවිය පරිශීලනය කිරීම අත්‍යාවශ්‍යය වේ.

VIII. **නියමිත දිනට ඉහත පරීක්ෂණය සඳහා සම්පූර්ණ කරන ලද අයදුම්පත් ඉදිරිපත් කළ සිසුන්ගේ විභාග ප්‍රවේශ පත්‍ර external.sjp.ac.lk/ B.Sc. Business Studies (General) External Degree/ Exam Admissions වෙත පිවිස ඔබගේ ජාතික හැඳුනුම්පත් අංකය V අක්ෂරය රහිතව ඇතුලත් කිරීමෙන් ලබා ගත හැකි අතර විභාග ප්‍රවේශ පත්‍ර තැපැල් මාර්ගයෙන් නිකුත් නොකරන බව කාරුණිකව දන්වා සිටිමි.**

ජ්‍යෙෂ්ඨ සහකාර ලේඛකාධිකාරී
බාහිර උපාධි හා විස්තාරිත පාඨමාලා ඒකකය
2025-01-16